පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
**DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)**

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனதுஇலக்கம்<br>My No. | LGD/ | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.03.17 |

චක්‍රලේඛ අංක : LGD/03/2020

බස්නාහිර පළාතේ
**සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,**

**<u>කොරෝනා වෛරසය - (COVID 19) තුරන් කිරීම සඳහා</u>**
**<u>පළාත් පාලන ආයතන විසින් ගතයුතු ක්‍රියාමාර්ග</u>**

ශ්‍රී ලංකාව තුල මේ වනවිට කොරෝනා වෛරසය ව්‍යාප්තිය පාලනය සම්බන්ධව රජයේ මැදිහත්වීම මත සිදුකරන වැඩසටහන් තවදුරටත් ශක්තිමත්ව ඉටුකිරීම සඳහා පළාත් පාලන ආයතන මට්ටමින් ලබාදිය හැකි උපරිම දායකත්වය පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කරමි.

02. විශේෂයෙන්ම මහා නගර සභා ආඥා පනතේ 96 වගන්තිය, නගර සභා ආඥා පනතේ 103 වගන්තිය සහ ප්‍රාදේශිය සභා පනතේ 79 වගන්තිය යටතේ විස්තර වන බල ප්‍රදේශය තුල මහජන සෞඛ්‍ය පිළිබඳව පොදු පරිපාලන අධිකාරිය වශයෙන් ඔබ පළාත් පාලන ආයතනය වන හෙයින් ඊට අනුකූලව කටයුතු කරමින් රෝග ව්‍යාප්තිය පාලනය සඳහා රජය ගෙන යන වැඩපිළිවෙලට නිසි සහය ලබාදිය යුතු බව අවධාරණය කරමි.

03. ඒ සඳහා රජයේ සෞඛ්‍ය සේවාවන් හා රෝහල් සේවාවන් තවදුරටත් උපරිම ලෙස කාර්යක්ෂම කිරීමෙහිලා අවශ්‍ය දායකත්වය ලබාදීම උදෙසා රෝහල් ප්‍රධානීන් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් නිරන්තරයෙන් සම්බන්ධීකරණය කරමින් අවශ්‍යතා හඳුනාගන්නා ලෙස දන්වා සිටිමි.

04. තවද එසේ හඳුනාගන්නා අවශ්‍යතා සඳහා මහා නගර සභා ආඥා පනතේ 188(1)(ඒ) අනුවගන්තිය, නගර සභා ආඥා පනතේ 159(1) (ආ) අනුවගන්තිය සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 19(1) (VII) අනුවගන්තිය යටතේ වූ නීතිමය විධිවිධාන අනුව පළාත් පාලන ආයතන අරමුදලින් ඊට අදාළව වියදම් දැරීම සඳහා විධිවිධාන සැලසි ඇති බවද පෙන්වා දෙමි.

05. ඒ අනුව අදාල රෝහල් බලධාරීත්වය මෙන්ම බල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සම්බන්ධීකරණය කරගනිමින් රෝග ව්‍යාප්තිය පාලනය කරගැනීම සඳහා වන අවශ්‍යතා හඳුනා ගනිමින් පවත්නා වර්ෂයේ ඊට අදාල ප්‍රතිපාදන සීමාවන් තුල අවශ්‍ය වියදම් දැරීම සඳහා ක්‍රියාකරන ලෙස දන්වමි. තවද ඒ වෙනුවෙන් වන මිළදී ගැනීම් වේනම් රෝහල් ප්‍රධානීන් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විමසා හැකිතාක් අදාල රෝහල් යටතේ ක්‍රියාත්මක වන ප්‍රසම්පාදන කමිටු මගින් ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකර ගන්නා ලෙසත් වැඩිදුරටත් දන්වමි.



| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලිපිනය / முகவரி/**Address** | අංක **204**, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / **இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla** | | | | | | | | | |
| දුරකථන<br>தொலைபேசி<br>**Telephone** | පොදු<br>General<br>2093156 | කොමසාරිස්<br>Commissioner<br>2092570 | පාලන හා මානව සම්පත්<br>Admin / HR<br>2092574/2092576 | නීති<br>Legal<br>2092572 | සැලසුම්<br>Planning<br>2092571 | ගිණුම්<br>Accounts<br>2092573 | විමර්ශන<br>Investigation<br>2092580 | ආයතන පරිපාලන<br>Establishment<br>2092582 | ප්‍රජා සංවර්ධන<br>Community Development<br>2092583 | |
| ෆැක්ස් / **பெக்ஸ்/ Fax** | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/**Web** | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ **Email** | lgd@wpc.gov.lk | | | | | |

06. ඉහත කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන ලෙසත් මෙම අවස්ථාවේ ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා අදාල උපදෙස් ක්‍රියාත්මක කරන ලෙස අවධාරණයෙන් දන්වා සිටිනු කැමත්තෙමි.

කසුන් ඇසා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් -

1. ගරු ආණ්ඩුකාරතුමිය - කාරුණික දැ.ගැ.ස
2. ප්‍රධාන ලේකම් (බ.ප) - කාරුණික දැ.ගැ.ස
3. පළාත් පාලන ලේකම් (බ.ප) - කාරුණික දැ.ගැ.ස
4. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (බ.ප) - කාරුණික දැ.ගැ.ස
5.